**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

මැයි - 2023

**BMGT E2025 - මානව සම්පත් කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය: පැය 03 යි

**පළමු ප්‍රශ්න (01) ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න අංක **01**

ලක්ෂිකා සේවකයන් දස දෙනෙකු පමණ සිටින ආයතනයක හිමිකාරිය වන අතර, ආයතනයේ අනෙකුත් අංශ කෙරෙහි අවධානය වැඩිපුර යොමු කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය භාර ගැනීමට ඔබව බඳවාගෙන ඇතැයි සිතන්න. පළමු සති දෙක තුළ, ආර්ථික අවපාතය ආයතනයට දරුණු ලෙස බලපා ඇති බව හා ඉදිරි වසර තුන තුළදී ආදායම 10% ක පමණ අඩු වීමක් අපේක්ෂා කළ හැකි බවත් සමහර කාර්තුවලදී එය 30% ක් පමණ ඉහළ අගයක් වනු ඇති බවත්, ඔබ විසින් සොයාගෙන ඇත. තවද සේවකයන් දස දෙනාගෙන් පස් දෙනෙකු ඉදිරි වසර තුන තුළදී විශ්‍රාම ගනු ඇතැයිද අපේක්ෂා කෙරේ. මෙම සේවකයන් ආයතනයේ මුල සිටම රැඳුනු අය වේ. අනෙකුත් සේවකයන් පස් දෙනා විවිධ වයස් මට්ටම්වල අය වේ.

මෙම වෙනස්කම්වලට අමතරව සතියකට දවසක් හෝ දෙකක් දූරකථන ජාල හරහා දූරස්ථ ක්‍රමයට (telecommuniting) සේවයන්ට වැඩ කිරීමට අවස්ථාව දීමෙන් වියදම් අඩුකරගත හැකි බවද ලක්ෂිකා විශ්වාස කරයි. තවද සේවකයන්ට නිවසේ සිට වැඩකිරීමට ඉඩ දෙන්නේ නම්, එය ඵලදායිතාවයට බලපෑ හැකි බවද ඇය සිතයි. මෙම සියලු සලකා බැලීම් හමුවේ, තම ආයතනයේ භෞතික කාර්යාලය වසා දමා අථත්‍ය (virtual) සංවිධානයක් කිරීමට සලකා බලා ඇති අතර, එය කෙතරම් දුරට සේවකයන් සමඟ ඇති සන්නිවේදනයට සහ ඔවුන්ව අභිප්‍රේරණය කිරීමට බලපායි ද යන්න ගැටළුවක්ද ඇයට ඇත.

ලක්ෂිකා සංවිධානයේ සෞඛ්‍ය පරිපාලන වියදම් පිළිබඳවද ඔබ සමඟ සාකච්ඡා කර ඇත. පූර්ණකාලීන සේවා වෙනුවට සේවකයන්ව කොන්ත්‍රාත් පදනම මත සේවයට යෙදවීමටත්, සෞඛ්‍ය ප්‍රතිලාභ සම්පූර්ණයෙන් කප්පාදු කිරීමටත් ඇය සළකා බලා ඇති නමුත් මෙය සුදුසු විකල්පයක් දැයි ඇයට විශ්වාසයක් නොමැත. කෙසේ නමුත් යෝජිත ගෙවීම් ක්‍රමය ගැන සේවකයන්ගේ අදහස් මිශ්‍ර අදහස් වේ. සමහරු ඒ පිළිබඳව පැහැදීමකින් කථා කරන අතර, සමහරු ඒ ගැන බියජනක ලෙස සිතයි.

පැරණි සම වැටුප් පද්ධතිය (Equal Pay System) වෙනුවට කාර්යඵල පාදක කරගත් (Performances Based) ගෙවීම් ක්‍රමයක් හඳුන්වාදීමටද සමාගම අදහස් කර ඇත. මේ සියලු අදහස් හුවමාරු කරගැනීමට සාකච්ඡා හමුවක්ද ලක්ෂිකා ඔබ සමග නියම කර ඇත. ඊට සූදානම්වීම සඳහා ඔබ යම් විමර්ශනයක් දියත් කර ඇති අතර එමගින් ගැටලු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් තම නව සේවා යෝජකයාගේ සිත දිනාගැනීමටත් ඔබ බලාපොරොත්තු වේ.

අ) ව්‍යාපාරයේ මානව සම්පත් කළමනාකරණයට බලපාන කුමන ප්‍රශ්න මෙම ආයතනයේ හටගෙන ඇත්දැයි නම් කරන්න.

(ලකුණු 05)

ආ) අනාගත මානව සම්පත් කළමනාකරණ ගැටළු ලෙස ආයතනයේ මානව සම්පත් කළමනාකරණය කුමන ගැටළුවලට මුහුණ දෙයිද?

(ලකුණු 07)

ඇ) ඉහත (ආ) මඟින් ඔබ හඳුනාගත් මානව සම්පත් කළමානකරණයට බලපාන මානව සම්පත් කළමනාකරණ ගැටළු විසඳීම සඳහා කුමන මානව සම්පත් කළමනාකරණ විසඳුම් සහ යෝජනා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබයිද?

(ලකුණු 10)

ඈ) මෙම වෙනස්කිරීම් ක්‍රියාවලියේදී, ලක්ෂිකාගේ භූමිකාව කුමක් විය යුතුද?

(ලකුණු 06)

**(මුළු ලකුණු 28)**

**ප්‍රශ්න අංක 02**

අ) 'ආයතනවල අනාගත හොඳ කාර්යඵල සඳහා, හොඳම දක්ෂයන් (best talent) බඳවා ගැනීම හා ඔවුන්ගේ රැකියා තහවුරු කිරීම මානව සම්පත් කළමනාකරණයේ අභිප්‍රාය වේ.'
ඉහත ප්‍රකාශයේ වලංගුතාවය පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

ආ) "මානව සම්පත් කළමනාකරණය හා මානව සම්පත් සංවර්ධනය යන දෙකම ආයතනවල කාර්යසාධනය සඳහා මිනිසුන් උපයෝජනය කිරීමේ හැකියාව තහවුරු කිරීම කරයි."
උදාහරණ දෙමින් මෙම ප්‍රකාශයේ වලංගුතාව පෙන්වා දෙන්න.

(ලකුණු 09)

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 03**

අ) පුහුණුව හා සංවර්ධනය අතර වෙනස්කම් පහදන්න.

(ලකුණු 05)

ආ) උදාහරණ අනුසාරයෙන් පුහුණු වැඩසටහන් සකස් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 13)

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 04**

අ) කාර්යඵල කළමනාකරණයක් තුළින් සිදුවන්නේ කුමක්ද?

(ලකුණු 05)

ආ) කාර්යඵල කළමනාකරණ ක්‍රියාවලියේ පියවර හා එම එක් එක් පියවරවලින් අපේක්ෂා කරන ප්‍රතිඵල පැහැදිලි කරන්න.

(ලකුණු 13)

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 05**

අ) "රැකියා නිර්මාණය" නිර්වචනය කරන්න. රැකියා නිර්මාණයේ ප්‍රධාන මූලිකාංග දෙක (02) සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

ආ) "රැකියා විස්තරය හා රැකියා පිරිවැතරය යනු රැකියා විශ්ලේෂණයේ ප්‍රතිඵලයන් දෙකකි."
මේ ලේඛණයන්ගෙන් අදහස් වන්නේ කුමක්ද? එම ලේඛණයන්ගේ සංරචක විස්තර කරන්න.

(ලකුණු 09)

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 06**

අ) "සේවක ආකර්ෂණය මානව සම්පත් කළමනාකරණයේ ඉතා වැදගත් කාර්යයකි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) බාහිර ආකර්ෂණ ක්‍රම පහක් (05) හඳුනාගෙන ඒ එක එක ක්‍රමයෙහි වාසි හා අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 07**

අ) මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීම හා මානව සම්පත් සැපයුම තක්සේරු කිරීම අතර වෙනස කුමක්ද?

(ලකුණු 09)

ආ) "සම්මුඛ පරීක්ෂණ, සේවක බඳවා ගැනීම් ක්‍රියාවලියේ හදවත බඳුය." ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 09)

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 08**

අ) 'වෘත්තීය සෞඛ්‍යය' හා 'වෘත්තිය ආරක්ෂාව' අතර වෙනස කුමක්ද?

(ලකුණු 05)

ආ) වෘත්තීය රෝග සඳහා බලපාන සාධක විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ) වෘත්තීය රෝග වලක්වා ගත හැක්කේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 18)**